# මගේ ලෝකය

## ඇසෙන දැනෙන දේ..
## හිතට වැදෙන දේ..

ඔහුගේ නිවසේ ආලින්දයේ පුටුවකට බර දී පෙරේරා මැතිණිය වෙතින් ලද තේ කෝප්පයක් තොල ගාමින් මම කාව්‍ය නිර්මාණකරණය හා ගීත රචනය පිළිබඳ ජීවිතයේ ලද පළමු පාඩම සුනිල් සරත් පෙරේරා මහතා වෙතින් එදා ඉගෙන ගත්තෙමි. උපමා රූපක වැනි සාහිත්‍ය උපක්‍රම මා පළමු වතාවට උගත්තේ ඔහු වෙතින් ය. මා ගෙන ගිය කවි කීපයේ අඩුපාඩු පෙන්වා දී ඒවා කපා කොටා සිය අත්අකුරෙන් ම නිවැරදි කළ හැටි තවමත් මතක ය............
අපේ ඒ පළමු හමුවීමෙන් පසු මට ලංකාවේදී ඔහු නැවත හමු නොවී ය.......

සාහිත්‍ය ය සිනමාව නාට්‍යය ගීතය සංගීතය ගුවන් විදුලිය ආදී සකල විධ කලාවන්හි මහත් ප්‍රබෝධයක් පෙන්වූ යුගයකි 1970 දශකය. පාසල් යන කොලු ගැටයන් වූ අපට ද මේ පුබුදුව නොදැනුණා නොවේ.

මහගම සේකර බුද්ධදාස ගලප්පත්ති ප්‍රේමකීර්ති ද අල්විස් සුනිල් ආරියරත්න සුගතපාල ද සිල්වා සයිමන් නවගත්තේගම ප්‍රේමසිරි කේමදාස ධරමසේන පතිරාජ ගාමිණී ෆොන්සේකා ලෙස්ටර් ජේම්ස් පීරිස් (ඇතුලු තවත් බොහෝ අය) අපේ ලෝකයේ වීරවරයෝ වූහ. ඔවුහු සිය නිර්මාණ ඔස්සේ අපේ සිත් වැඩි වශයෙන් සසළ කළේ මේ යුගයේ දී ය. දුහුනන් වූ අපි ඔවුනගේ නිර්මාණ තුළින් ලද ආශ්වාදයෙන් මත් ව සිටියෙමු.

ප්‍රේමකීර්ති ද අල්විස් ප්‍රමුඛ ගුවන් විදුලි ශිල්පීහු රැසක් ශ්‍රී ලංකා ගුවන් විදුලිය ඔස්සේ අපූරු වැඩසටහන් පෙළක් ඉදිරිපත් කරමින් සිටියහ. සෙනසුරාදා උයද වරුවේ එක් එක් ගුවන් විදිලි ශිල්පියාට පැය බැගින් වෙන් කෙරුණ ශනිදා සාදය නම් වූ වැඩ සටහන ට අමතරව සෑම සතියේ දිනක ම සවස සොඳුරු සෙවණ නම් වූ වැඩ සටහනක් ද ගුවන් ගත විය. මේ යුගයේ ළමා මණ්ඩපය ද ළමුන් අතර ජනප්‍රිය වූ වැඩ සටහනක් විය. (මගේ පළමු ගුවන් විදුලි වැඩ සටහන මා ලිව්වේ ළමා මණ්ඩපයට ය. එය අකුණු ගැසීම පිළිබඳ විද්‍යාත්මක පසුබිම විස්තර කෙරෙන නාට්‍යයක් ලෙසින් සකස් කළ කුඩා වැඩ සටහනකි. වැස්ස අකුණු ශබ්ද පසුබිමින් යොදා ගෙන අපූරුවට නිෂ්පාදනය කර තිබූ ඒ වැඩ සටහන ගුවන් විදුලියෙන් ප්‍රචාරය වූ දා මා විඳි සතුට අදටත් මට දැනෙයි)

අඟහරුවාදා සොඳුරු සෙවණේ සෑහෙන කාලයක් වෙන්ව තිබුණේ ආධුනික නිර්මාණ කරුවනගේ කවි නිර්මාණ ඉදිරිපත් කරන්නට ය. මේ වැඩ සටහන ඉදිරිපත් කළේ එවකට ද ඉහළ නමක් දිනාගත් ගීත රචකයකු වූ සුනිල් සරත් පෙරේරා ය. නිර්මාණකරුවන් එවන නිර්මාණ ඉදිරිපත් කරනවාට අමතරව යම් යම් තෝරාගත් නිර්මාණ අගය කිරීමද ඔහු අතින් සිදුවිය. මේ අගැයීම් ඉවකින් මෙන් නිර්මාණකරණයට පිවිසෙමින් සිටි අපට මහත් රුකුලක් විය. එවකට සාමාන්‍ය පෙළ පන්තියේ ඉගෙනුම ලබමින් සිටි මම ද වැඩ සටහන අසා සිටීමෙන් නොනැවතී මගේ ශක්ති පමණින් කවි ලියා යැව්වෙමි. කිසිදාක මගේ කවියක් ප්‍රචාරය නොවූ අතර කවි එවූ අයගේ නාමලේඛණයේ මගේ නම කියවෙනවා අසා සිටීමෙන් පමණක් සෑහීමට පත් වන්නට මට සිදුවිය.

සිය නිවසට පැමිණ තමා හමුවන්නැයි සුනිල් සරත් පෙරේරා මහතා මට දන්වන්නේ මේ අතර දී ය. මම අමන්දානන්දයට පත් වීමි. ඔහු ගීත රචනා ක්ෂෙත්‍රයේ පතාක යෝධයෙකි. එවැන්නකුගෙන් ලැබෙන ඇරයුමක් ඉතා වටියි. කිරුළපන මායා මාවතේ පිහිටි ඔහුගේ නිවසේ දී සුනිල් සරත් අයියා හමුවූ දිනය අද මෙන් මතක ය.

ඔහුගේ නිවසේ ආලින්දයේ පුටුවකට බර දී පෙරේරා මැතිණිය වෙතින් ලද තේ කෝප්පයක්

තොල ගාමින් මම කාව්‍ය නිර්මාණකරණය හා ගීත රචනය පිළිබඳ ජීවිතයේ ලද පළමු පාඩම සුනිල් සරත් පෙරේරා මහතා වෙතින් එදා ඉගෙන ගත්තෙමි. උපමා රූපක වැනි සාහිත්‍ය උපක්‍රම මා පළමු වතාවට උගත්තේ ඔහු වෙතින් ය. මා ගෙන ගිය කවි කීපයේ අඩුපාඩු පෙන්වා දී ඒවා කපා කොටා සිය අත්අකුරෙන් ම නිවැරදි කළ හැටි තවමත් මතක ය.



සුනිල් සරත් පෙරේරා, ජගත් එදිරිසිංහ, ශ්‍රී නාත් සහ ශ්‍රියානී මද්දුමගේ

මහ වෙල් යායයි
මහ වැව් යායයි
රන් මැළි මහ සැයයි....
මහාවැලී මහ ගඟ උතුරා එන
නිවහල් දෑ ගීයයි.....

අපේ ඒ පළමු හමුවීමෙන් පසු මට ලංකාවේදී ඔහු නැවත හමු නොවී ය.

අදද දුහුනන් අතින් කවි ගී ලියැවෙයි. ඒ ගැන ඇස් ඇර බලා කතා කරන ප්‍රවීණයන් අද හිඟ ය. වරද්ද වරද්දා නිර්මාණ කරන ආධුනික ලේඛකයකු කැඳවා ඔහුට උපදෙසක් දෙන්නට සිතන ආධුනිකයා දිරිමත් කරවන වදනක් දොඩන ප්‍රවීණයන් ගැන අද අසන්නට ලැබෙන්නේ කලාතුරකින් ය.

(මට කිසිදා හමු නොවුණ නමුදු මා දිරිමත් කරවන වදනක් ලියා එවූ ප්‍රවීණයකු පිළිබඳ මතකයක් ලියා තබන්නට මේ අවස්ථාව සුදුසු යයි සිතමි. මගේ 'කන්ද උඩ මාලිග ාව' කෙටිකතා සංග්‍රහය නිකුත් වූ පසු මම එහි පිටපතක් ප්‍රවීණ කෙටිකතාකරුවකු වන ජයතිලක කම්මැල්ලවීර ශූරීන්ට තැපැල් කර යැව්වෙමි. ඔහු පොත පිළිබඳව ප්‍රසංශා කළා පමණක් නොව එහි තිබූ ව්‍යරණ දොස් කීපයක් ද පෙන්වා දුන්නේ ය. ''පොතක් මුද්‍රණයට යවන්නට පෙර ව්‍යරණ දත්තකු ලවා එහි ඇති ව්‍යරණ වැරැදි නිවැරදි කරගත යුතු ය'' යි ඔහු දුන් ඔවදන අද ද මම පිළිපදින්නෙමි. එපමණකින් නොනැවතුන කම්මැල්ලවීර මහතා පසු කළෙක පුවත් පතක පළ වූ මගේ ''ගන්ධබ්බ'' නම් වන කෙටි කතාව ජයවර්ධනපුර සරසවියේ දේශණයක දී සාකච්ඡාවට බඳුන් කළ බව ද මට දැනගන්නට ලැබුණි.)

මේ හා සමාන වූ තවත් අද්දැකීමක් මට ඇත.

මා පළමු නවකතාව ලියන විට වයස අවුරුදු 11 ක් පමණ වන්නට ඇතැයි සිතමි. ඒ නවකතාවේ නම 'ලන්දෙගම' විය. මුවන්පැලැස්ස ගුවන් විදුලි නාට්‍යයට පෙම් බැඳගත් මම මුවන්පැලැස්ස මෙන් කැලයෙන් වට වූ ගමක කතාවක් ලියන්නට ගත් උත්සාහයයි ඒ. 'අලුත් ඉරක් පායලා' නමින් මම ඒ කතාවේ දෙවන කොටසක් ද ලිව්වෙමි. මේවා හුදු ආත්ම තෘප්තිය උදෙසා මොනිටර් අභ්‍යාස පොත් වල ලියන ලද නවකතා විය. තෙවෙනි නවකතාව ලිව්වේ 70 දශකයේ දෙවන භාගයේ මා උසස් පෙළ පන්තියේ ඉගෙනුම ලබන අතර දී ය. ඒ කතාවේ නම දැන් මට මතක නැත. සංගීත කණ්ඩායමක තරුණ තරුණියන් කීප දෙනෙකු වටා කතාව ගෙතුණ බව පමණක් මතක ය. මේ තෙවන නවකතාව මුද්‍රණය කරවාගැනීමේ බලවත් ආශාවක් මගේ සිතේ විය.

ප්‍රවීණ ලේඛක ජයකොඩි සෙනෙවිරත්න ගේ මල් මැණිකේ නවකතාව මුද්‍රණයෙන් පිට වූයේ මේ වකවානුවේ ය. තමා නවක ලේඛකයනට අත දුන් අන්දම පිළිබඳ සෙනෙවිරත්න ශූරීන් ලියූ සටහනක් ඒ නවකතාවේ විය. මගේ නවකතාව මුද්‍රණය කරගන්නට උපකාර කරන්නැයි ඉල්ලා ලිපියක් මම ඔහුට යැව්වෙමි. පොත කියවා බැලීමට තමා වෙත එවන්නැයි ඔහු ලිපියකින් මට දැන්නුවේ ය. මම පොත තැපැල් කළෙමි. පානදුරයේ තමාගේ නිවසට පැමිණ තමා හමුවන්නැයි ඔහු මාසයකට පමණ පසු මට ලිපියකින් දන්වා සිටියේ ය. මම නුගෙ 'ගොඩින් 183 බසයක නැගී පානදුර වලානේ බුද්ධ ප්‍රතිමාව අසලින් බැස ඔහුගේ නිවස සොයා ගියෙමි.

මා සුහදව පිළිගත් මේ ප්‍රවීණ ලේඛකයා මගේ නවකතාව පිළිබඳව අදහස් දැක්වීමක් කළේ ය.

''ඔයාගෙ භාෂාව හොඳයි.. ඒත් තව ජීවිත අද්දැකීම් එකතුවෙනකල් ඉන්න.. දැන්ම පොතක් ප්‍රින්ට් කරන්න හදන්න එපා..'' ඔහු කී හැටි තවම මතක ය. මම ඔහුට එකඟ වීමි. කොයි තරම් එකඟ වූවාදැයි කිවහොත් මගේ පළමු පොත මුද්‍රණය වූයේ ඒ සිදුවීමෙන් වසර විස්සකටත් පසුව ය.



ජගත් ජේ එදිරිසිංහ

''පෙරදිනයක මා පෙම් කළ යුවතිය සිය පුතු නළවනවා
මගේම ගීයක් නැළැවිලි ස්වරයේන ඇතින් මතු වෙනවා'' යි ලියූ සුනිල් සරත් පෙරේරා නම් වන නිර්මාණකරුවා (එදා සිය නිවසේ ආලින්දයේ මා වාඩි කරවාගෙන කවිය පිළිබඳ පාඩමක් කියා දුන් සුනිල් සරත් අයියා) නැවත මට මුණ ගැසුණේ පසුගිය දා මෙල්බන් හි ශ්‍රීනාත් මද්දුමගේ සොයුරා ගේ නිවසේ දී ය.

ඒ අපේ පළමු හමුවීමෙන් අවම වශයෙන් වසර 30 කටවත් පසුව ය. එනමුදු ඔහු තවමත් එදා සිටි නිරහංකාර සුනිල් සරත් අයියා ම ය.


Palitha (Pali)
Licenced Vehicle Tester
(RWC)

SRI LUCK AUTO P/L



Tel 9769 1617
Mob 0425 852 720
Fact 3/32 Cambria Rd
Keysborough Vic 3173

ඔබේ වාහනයේ සියළු කාර්මික
අවශ්‍යතා සඳහා දස වසරක ඇප කැපවීම

Complete Service for
Clutches
Brakes
Tune Ups
All Makes
All Models
Computer Fault Diagnosis




SRI LUCK AUTO P/L